# දික්වැල්ල ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල මිලට ගෙන තිබුණු රු.142,639 ක් වූ වත්කම් විෂයයන් 05 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් මිලට ගන්නා ලද පුස්තකාල පොත් වටිනාකම රු.378,792 ක් වුවද රු.283,267 ක් ලෙසට ප්‍රාග්ධනිත කර තිබුණෙන් අඩුවෙන් ගිණුම් ගතවී තිබූ මුදල රු.95,525 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ වටිනාකම රු.15,482,402 ක් වූ අතර ප්‍රධාන ලෙජරයට අනුව වටිනාකම රු.23,159,092 ක් වූයෙන් රු.7,676,690 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ගිණුමේ වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම සමාන විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් වල වටිනාකම රු.135,953,163 ක්ද ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.136,711,539 ක්ද වූයෙන් වෙනස රු.758,376 ක් විය.

(ඉ) ඉකුත් වර්ෂයේ වියදම් ණයහිමි වටිනාකම උපලේඛනයේ අඩුවෙන් දැක්වීම එම උපලේඛනයේම නිවැරදි කරනවා වෙනුවට ජර්නල් සටහන් අංක 40 මගින් රු.39,849,350 ක මුදලක් වියදම් ණයහිමි ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකමින් වියදම් ණයහිමි වටිනාකම අඩුවීමද සමුච්චිත අරමුදල වැඩිවීමද සිදුව තිබුණි.

(ඊ) සභාවේ ඇප තැබිය යුතු නිලධාරීන් 13 දෙනෙකු වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඇති රු.8,500 ක තැන්පත් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල අයවී තිබූ රු.1,161,538 ක උසාවි දඩ ලැබීම් මුද්දර ගාස්තු ලැබීමක් ලෙසට දක්වා තිබුණි. මේ හේතුව නිසා මුද්දර ගාස්තු ආදායම වැඩිවීමද උසාවි දඩ ආදායම් ලැබීම් අඩුවීමද සිදුව තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මුද්දර තැන්පත් ගිණුමෙහි මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.101,133 ක් වූ අතර උපලේඛන අනුව හා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වටිනාකම රු.132,955 ක් වූයෙන් වෙනස රු.31,822 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම්වල වටිනාකම රු.3,907,625 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් වල වටිනාකම රු.138,311,971 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.153,004,743 ක් වටිනා ගිණුම් විෂයයන් 06 කට අදාලව යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, කාල විශ්ලේෂණ වාර්තා යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.5 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 217 සහ 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එසේ කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.2,248,182 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.627,340 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 2,545 | 1,802 | 1,566 |
| කුලී මුදල් | 5,463 | 4,136 | 1,473 |
| වෙනත් ආදායම් | 37,666 | 42,550 | 125,014 |

2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ බිල්කර තිබුණු වරිපනම් බදු මුදල රු.1,411,658 ක් වූ අතර එකී මුදලින් වර්ෂය තුල අයකරගෙන තිබුනේ රු.738,450 ක් පමණක් වූයෙන් අයවීමේ ප්‍රගතිය සියයට 52 කි. එසේම සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟහිටි වරිපනම් බදු රු.1,358,801 ක් වූ අතර ඉන් රු.409,162 ක් අයකරගෙන තිබුණු අතර අයවීමේ ප්‍රගතිය සියයට 30 කි.

2.2.3 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ බදුකුලී මුදල රු.818,167 ක් වූ අතර සමාලෝචිත වර්ෂයට බිල්කළ මුදල රු.1,889,630 ක් විය. සමාලෝචිත වර්ෂය තුල මුළු ලැබීම් රු.1,594,289 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව අයවීමේ ප්‍රගතිය සියයට 59 කි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 379,973 |
| (ආ) | මුද්දර ගාස්තු | 8,594,974 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

2015 ජනවාරි 31 දිනැති සමීක්ෂණ වාර්තාව පරිදි සභාවේ භාණ්ඩ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(අ) ආයුර්වේද බෙහෙත් ශාලා දෙකක බෙහෙත් වර්ග 91 ක් අතැති තොග ලෙස දක්වා ඇතත්, ඒවායේ වටිනාකම භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල දක්වා නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වටිනාකම් සමඟ සැසඳීමට නොහැකි විය.

(ආ) සභාවේ ප්‍රධාන කාර්යාලයට අයත් ඉන්වෙන්ට්‍රි කාණ්ඩ 28 කට අයත් භාණ්ඩ 84 ක ඌනතාවයක් වූ අතර කාණ්ඩ වර්ග 14 ට අයත් භාණ්ඩ 48 ක අතිරික්තයක් ද පැවති අතර ඌනතා වටිනාකම් සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයන්ගෙන් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු පුස්තකාල තුනෙහි පොත් 134 ක ඌනතාවයක් වූ අතර ඒ සම්බන්ධයෙන්ද වගකිවයුතු තැනැත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 02 | 02 | - | - |
| ද්විතියික | 29 | 26 | 03 | - |
| ප්‍රාථමික | 51 | 55 | - | 04 |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 08 | - | 08 |
| එකතුව | 82 | 91 | 03 | 12 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.20,454,406 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් හා සභික දීමනා ලෙස රු.21,547,675 ක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.1,093,269 ක වැයබරක් වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

සභාවේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

### 4.2 අයවැය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් සහ තත්‍ය ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් සභාවේ අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය